ජෝ වීල් (Joe Veale) වෙතින් සිරකරුවන්ට,

# The Revolution Needs You.
# විප්ලවයට ඔබව අවශ්‍ය යි.

සිපිරිගෙයි දුක් විඳින මාගේ සහෝදර සහෝදරියන්ට,

විප්ලවයට ඔබව අවශ්‍ය යි. විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයේ සභාපති බොබ් අවේකියන් (Bob Avakian) විසින් ලොව පුරා දියත් කරන ලද කොමියුනිස්ට් විප්ලවයේ නව රැල්ලක් සඳහා මුල පිරීමට ගෙන යන අරගලයට සවිඥානිකව හා ක්‍රියාශීලීව සහභාගි වීමට ඔබව අවශ්‍ය යි.

**විප්ලවය අපට අවශ්‍යය......නායකත්වය අපට ඇත....** යන දැවැන්ත ප්‍රකාශනය මෑතකදී විප්ලවීය කොමියුනිස්ට් පක්ෂය (RCP) එළි දක්වා ඇති බව සමහර විට ඔබ දන්නවා ඇත.

මෙම ප්‍රකාශනය වනාහි බොහෝ පාර්ශවයන්හි හා මානයන්හි සංවිධානාත්මකව ගෙන යන ව්‍යවහාරයන්ට වැදෙන, ප්‍රවේශවන බහුජනතාව සම්බන්ධයෙන් මාස ගණනාවක් තිස්සේ අප පක්ෂය දක්වන ප්‍රයත්නවල කේන්ද්‍රය හා නාභිය යි.

එයට අන්තර් සම්බන්ධිත අරමුණු 3 ක් ඇත:

ප්‍රථමයෙන්, **මෙම විප්ලවය** පිළිබඳ ලොව වටා වෙසෙන දශලක්ෂ ගණන් ජනතාවගේ දැන ගැනීම පිණිස, ඇත්ත වශයෙන් සමාජ සිතියමේ විප්ලවය සලකුණු කිරීම අපේ අධ්‍යාශය වෙයි.

දෙවනුව, බොබ් අවේකියන්ගේ කටයුතුවලට, ඔහුගේ චින්තනයට මෙන්ම නායකත්වයද, පිළිගනිමින් දායකවන්නා වූ විශාල පිරිසක්ද, ඉන් පිටව යන පිරිසක්ද සිටින සමාජය පුරා බොබ් අවේකියන් සෑම මුවකින්ම නින්නාද වීමට සැලසීම අපේ අධ්‍යාශයයි.

තෙවනුව, ජනතාවගෙන් විප්ලවීය න්‍යෂ්ඨියක්, විප්ලවය ස්වකීය මෙහෙවර ලෙස දකී; මෙම විප්ලවීය ක්‍රියාදාමය (Line) උදෙසා ඇත්ත වශයෙන් අරගල කිරීමට; ඒ සඳහා ජනතාව දිරි ගැන්වීමට; විප්ලවවාදී ව්‍යාපාරය තුළ ඔවුන්ව සංවිධානගත කිරීමට; ඒ අතරම ඔවුන්ව කොමියුනිස්ට්වාදීන් බවට පත්කරලීමේ අරගලය නිර්මාණය කිරීමට; ප්‍රථමයෙන් කොමියුනිස්ට්වාදීන් බවට පත්කරලීමේ අරගලය නිර්මාණය කිරීමට; ප්‍රථමයෙන් කොමියුනිස්ට්වාදීන් බවට පරිවර්තනය වූ ඔවුන් විසින් ගොඩනගන ලද පක්ෂයට සම්බන්ධ කිරීමට, මෙම විප්ලවීය න්‍යෂ්ඨිය මෙහෙයවනු ලබන්නේ පක්ෂයේ දැක්ම (Vision) හා ක්‍රියා මාර්ගය විසිනි.

ඔබ දැනට පත්ව ඉන්නා තත්ත්වයන් යටතේ මෙම දැවැන්ත විප්ලවීය ප්‍රයත්නය සඳහා ඔබට දායක විය හැක්කේ කෙසේදැයි මෙහිදී විමසා බලමු.

අරගය හා සබැඳි - එතුළ අවස්ථා නිර්මාණය කරමින් - ගැඹුරින් ක්‍රියාත්මකවෙමින් - විප්ලවය පවත්වා ගෙනයාමේ ක්‍රියාවට බොහෝ පිරිස් දිනා ගනිමින්; සටන මෙහෙයවිය හැකි ''සුවිශේෂ'' ස්ථාවරයක ඔබ සිටී. ඒ පිළිබඳව සිතන්න.......

එක්කෝ මැදි විදුහල්වල, මහා විදුහල්වල, නොඑසේ නම් පාසල් නොගිය - විශේෂයෙන්ම මෙම සමාජයේ නගර කෙන්ද්‍රවල - යෞවනයෝ - දෙබිඩි පිළිවෙතකට ඇද දමන උගුලකට හසු කර ඇත; තවද සිතීමේ හා ක්‍රියාකාරී වීමේ තියුණු තරඟකාරී ක්‍රියාදාමයක් (Dog-eat-dog ways) තුළ ඔවුන් හිරකර ඇත; ලෝකය පුරා පවතින බලය හා තත්ත්වයන් ලබා ගැනීමේ තියුණු තරඟකාරී (rat race) ක්‍රමය ජනතාව පිට පටවා ඇත; එම සාක්ෂරතාවයෙන් සියල්ලෝම පෝෂණය කරයි - මෙම මළ ජරාවෙන් (Shift) හා විනාශයෙන් ගැලවීමට මෙම තරුණයන්ට හැකිය - එය අවශ්‍යමය; ඉනික්බිතිව විප්ලවය තුළ නැගී සිටිමු. එහෙත් යෞවනයන්ට පමණක් තනියෙන් එය කළ නොහැක; ඒ සඳහා ඔවුනට නායකත්වයක් අවශ්‍යය; එය ඔබේ විප්ලවයේ කාර්යයක් යයි සිතා; ''ඔබේ'' හඬ ඔවුන් තුළ අවදි කරන්න; එය ඉතා වැදගත්ය.

**''විප්ලවය'' (Revolution)*** පුවත්පතේ නිළ අන්තර්ජාල වෙබ් අඩවියේ {http://www.rwor.org} පළවන ලිපි මුද්‍රණය කර තරුණයන් හට ලැබෙන්නට සැලැස්වීම ප්‍රබල මෙන්ම උද්‍යෝගිමත් කාර්යයක් වනු නියතය. එසේම ඔබ ඒවා සංස්කෘතික, කලාත්මක, ප්‍රසාංගික ක්‍රියාකාරකම් වශයෙන් කියවීමට සලස්වන්න; පාසල් වලත් මං මාවත් වලත් කියවන්නට සලස්වන්න; නව යෞවනයන්ගේ ජීවිත යොමු විය යුත්තේ කුමකට ද යන්න පිළිබඳව සංවාද ගොඩ නගන්න; - සමස්ත පරපුරම කුමක් සඳහා ජීවත් විය යුතුද? එසේම මිය යා යුත්තේ කුමක් සඳහාද? යන්න පිළිබඳ අභියෝගය මුණ ගස්වන්න. මෙම විමුක්තිකාමී නිදහස ලැබීමේ යථාර්ථය වෙතට තරුණයන් සොලවා - අවදි කරවීම ඔබේ මෙහෙවරක් වෙයි.

* * * * * * *

විප්ලවය සඳහා අවැසි නායකත්වය දැන් අප සතුව ඇත. එම නායකත්වය විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයේ සභාපති බොබ් අවේකියන් ය (Bob Avakian).

විප්ලවීය යාත්‍රාව ආරම්භයේ සිට අවසානය දක්වා පදවනායුරු අවබෝධ කර ගත් නිර්මාණකරුවකු අවතීර්ණය වීම ඉතිහාසයේ ඉතා විරල දෙයක් වෙයි. මේ සියල්ල සමස්ත මානව වර්ගයාගේ විමුක්තිය උදාකිරීම පැහැදිලිවත්, විද්‍යාත්මකවත් අවබෝධ කරගෙන සිටින්නේ කවරෙක්ද?

ඉතිහාසයේ ගමන් මගේ පසුගිය කාල වකවානුව තුළ නායකත්වය දරා සිටියේ අන් කවරෙක් නොව - ඒ **''මාඕ'' සහෝදර......සභාපති වරයා ය.**

මාඕගේ අභාවයෙන් පසුව, ප්‍රතිවිප්ලව වලට විප්ලවය තාවකාලිකව පසුපසට ඇද දැමිය හැකිවූවාට පසුව, පුද්ගලිකව, නිදිනැති රාත්‍රී ගණනාවක්ම පහන් කළ මා පසුවූයේ දැඩි කැළඹීමකින්ය.

මෙවැනි ප්‍රචණ්ඩ කැළඹිලි ඇතිවූයේ මන්ද? නොනිදා රැය පහන් කරන්නේ මන්ද? ලෝකය නැවත නිර්මාණය කිරීමට අපට වුවමනා නායකත්වය බහුජනතාවට ලැබෙයිද නැද්ද යන්න පිළිබඳව මා දැඩි කනස්සල්ලට හා දැඩි මානසික පීඩාවට පත්විය. ලොව පුරා බහුජනතාව වෙත මාඕ දායාද කළේ නව ලොව නිර්මාණයයි - ඒ සඳහා වාස්තවික යථාර්ථය සවිඥානිකව, හා විද්‍යාත්මකව අපට අවබෝධ කරගැනීමට විභවයක් අත්කර දෙයි - ඒ මගින් ඓතිහාසික විප්ලවීය වෙනසක් ජයග්‍රාහීව නිර්මාණය කිරීමට අපට හැකි වේ.....

මෙය සොයමින් මා ලෝකය පිරික්සා බැලුවෙමි. පන්හිඳ අවියක් කොට ගත් එවැනි නායකත්වය ඍජුව සොයා ලොව නන්දෙස සැරි සැරීමට අදිටන් කර ගතිමි. සිරමැදිරියේ යකඩ කූරු අතරින් ආ ''අවේකියන්'' රචිත විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයක පත්‍රිකාවක් තුළින් නායකත්ව විභවයක් මා දුටුවෙමි. එහි සඳහන්ව තිබුණේ ''විප්ලවීය නොවන තත්ත්වයක දී විප්ලවීය කාර්යභාරය'' (Revolutionary Work in a Ton-Revolutionary Situation) - අවේකියන් (Avakian) දයලෙක්තික භෞතිකවාදයේ ක්‍රමවේදය අවබෝධ කරගත් අයුරු හා භාවිතයට යෙදිය හැකි අයුරු සම්බන්ධයෙන් ''මාගේ මනස ඇදී ගියේය''. මෙලෙස මාතෘකාව ආවරණය වී ඇත.

මෙකල, කොමියුනිස්ට්වාදී ලෝකයේ අවේකියන් **ලාබාලයකු** යැයි මා සැලකූ නමුත්, සහෝදර මාඕගේ ගමන් මග ස්පර්ශ කරමින් කොමියුනිස්ට් නායකත්වය සාක්ෂාත් කරගැනීමේ හැකියාව ඔහු වර්ධනය කරමින් සිටින බව මට සක්සුදක් සේ පැහැදිලි විය.

සමාජවාදය යටතේ විප්ලවය අඛණ්ඩව සිදුවිය යුතු බව සහෝදර මාඕ ගවේෂණය කර; එම අවබෝධය සංවර්ධනය කර තිබුණි - ඉන් ඔබ්බට, අවේකියන් ඉදිරියට අඛණ්ඩව වර්ධනය කර එහි නිම් වළලු පුළුල් කරමින් සිටී - මේ සම්බන්ධයෙන් සහෝදර මාඕගේ තේරුම් ගැනීම අවේකියන් වඩාත් නිර්මාණශීලීව රූ ගන්වා ඇත - අවශ්‍ය තන්හිදී ශුද්ධ පවිත්‍ර කර නවාකාරයට හැඩ ගන්වා ඇත. විමුක්ති මාර්ගය වැසී ඇති බාධක එළි පෙහෙලි කරමින් ඔහු විප්ලවය වඩාත් නිදහස්, හා වඩාත් විද්‍යාත්මක පදනමකින් විද්‍යාමාන වීමට සලස්වා ඇත.

ඉතිහාසයේ මීට පෙර පැවතියාට වඩා විප්ලවය වඩාත් සිදුකළ හැකි දෙයක් බවට පත්වීමේ හේතුව කුමක්ද....අප රටෙත්, ලොව පුරාමත් වෙසෙන බහු ජනතාව එය වටහා ගෙන සිටී; නිරීක්ෂණය කරති, එමෙන්ම සමස්ත විප්ලවය උදෙසා සටන් වදින නිසාය. එමතුදු නොව එය කොමියුනිස්ට්වාදය ගොඩනැගීම සඳහාය; සකල මානව වර්ගයාගේ පරිපූර්ණ විමුක්තිය උදා කිරීමටය.

අද අපිට සුවිශේෂ, විරල, අද්විතීය, වටිනා නායකයෙක් සිටී. විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ සඳහන්ව ඇති පරිදි ලොව පුරා වෙසෙන ජනතාවට ශ්‍රේෂ්ඨ සම්පතක් හා විප්ලවයේ ශ්‍රේෂ්ඨ විජයග්‍රහණයකි.

එසේ වුවත්, ප්‍රතිවිරෝධයක් පවතී. උත්ප්‍රාසයකි. එනම් විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපද සමාජීය ජනතාව මේ ශ්‍රේෂ්ඨ විජයග්‍රාහකයා, ශ්‍රේෂ්ඨ සම්පත්දායකයා පිළිබඳ නොදනී.

නමුත් බහුතරයක් වන නුඹලා, ඔහු ගැන දනී. නැවත වරක්, මේ තත්ත්වය වෙනස් කිරීමේදී ඔබට අතිශය වැදගත් භූමිකාවක් තිබේ. විප්ලවයේ අවශ්‍යතාව, බොබ් අවේකියන්ගේ නායකත්වයේ අතිමහත් වැදගත්කම, හා මේ සියල්ල වෙත නව පරම්පරාව සම්බන්ධ කරගැනීම පිළිබඳව ඔබගේ දෘෂ්ඨිය (insight) හා සංකල්පනාවන් ''විප්ලවය'' (Revolution) වෙත ලියා දක්වමින් ඔබට ඒ සඳහා දායක විය හැක.

එමෙන්ම ඔබගේ පවුලේ උදවිය හා මිතුරන් අතර ලිපි ගනුදෙනු කළ හැකිය. විප්ලවය පිළිබඳ සඳහන එදිනෙදා කථා බහේදී ව්‍යාප්ත කිරීම මගින් අන් අයට ද එසේ කළ හැකි වෙයි.

මෙම ලිපි දැන් දැන්ම පිට කරගත යුතු වෙමු. ඒවා වලින් සමහර ලිපි නව කලාප ලෙසින් හිරගෙදර ගැන මුද්‍රණය කළ යුතු වෙයි. ඒ වගේම ඔබේ අදහස්, සහ ආධාරයන් නොපමාව එවන්න. ඒවා ලැබෙන අපේක්ෂිත කාලයත් දන්වා එවන්න.

අවසාන වශයෙන්, පවත්නා තත්ත්වයන් යම් යම් සීමාවන්ට ඔබව යටත්කර රඳවා තබා ඇති මුත්, අන් අය ප්‍රබෝධමත් වන අයුරින් මා කථාකරන පරිදි ඔබද නිරතවන්න - වඩ වඩාත් මැද ස්ථාවරයේ පිරිස් ඇතුළු කර ගන්න. බොබ් අවේකියන් පිළිබඳව ඔබ වටහා ගත් දෑ සහ විප්ලවය සඳහා ඇති අවශ්‍යතාව, සකල විධ ජනතාවම විප්ලවය තුළට අවශෝෂණය කර ගැනීමේ මාධ්‍යය විය හැකිය.

අවබෝධකර ගැනීමේ ඔබගේ හැකියාව ගැඹුරුකර ගැනීම, ධනවාදී/අධිරාජ්‍යවාදී ක්‍රමයට පරාජය නොවී, එවැනි පුළුල් තත්ත්වයන්ට එරෙහිව කරන අරගලය ඔබ අඛණ්ඩව ඉදිරියට ගෙන යන්නා සේම, ඔබගේ විප්ලවීය පරිවර්තනයන්

නොනවත්වා කරගෙන යන්න.

**''විප්ලවය''** (**''Revolution''**) පිළිබඳ හැදෑරීම නොකඩවා කරගෙන යන අතර බොබ් අවේකියන්ට ලියන්න. ගැඹුරින්ම ඔහුව වටහා ගන්න; ඔහු විප්ලවීය දාර්ශනිකයෙක්, චින්තකයෙක්, නායකයෙක්, පුද්ගලයෙක් ලෙස හඳුනාගන්න. එවැනි නායකත්වයකට ඔහු නැඹුරු කළ හැරවුම් ලක්ෂය වටහා ගන්න. සත්‍ය ලෙසම ඔහුගේ ජීවන මග රැගත් පොත කියවන්න: ''Ike to Mao and Beyond:My Journey from Mainstream America to Revolutionary Communist.''

මානව වර්ගයා නිදහස් කර ගැනීම පිණිස හමා එන විප්ලවීය නව රැල්ල ඉදිරියට ගෙන යන ව්‍යාපාරයේ නව සාමාජිකයන් බවට (initiators) පත්වන්න.

උණුසුම් කොමියුනිස්ට් සහෝදරත්වයෙන් යුතුව,
ජෝ වීල් (Joe Veale).

* * * * * * *

සටහන්:
* **''විප්ලවය'' (Revolution)** - ඇමෙරිකා එක්සත් ජනපදයේ විප්ලවීය කොමියුනිස්ට් පක්ෂයේ නිළ පුවත්පත. {http://www.rwor.org}

පරිවර්තනය
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
අංක 05